ද මැසිනොද් විදුහල කඳාන 25.11.2016

**De Mazenod College - Kandana**

# දේශපාලන විද්‍යාව II

පැය 3

පළමුවාර පරීක්ෂණය

13 ශ්‍රේණිය

De Mazenod College Learning Resource Center

01) දේශපාලන ක්‍රීඩාව ක්‍රියාවට නංවන මාර්ග දෙකක් තිබේ. එම මාර්ග නම් කරන්න.

1. ..........................................................................

2. ..........................................................................

02) කරුණු දෙකක් හේතුවෙන් ග්‍රීක පෞර රාජ්‍යයන් තුළ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථකව ක්‍රියාවට නැංවිය හැකි විය. එම කරුණු දෙක නම් කරන්න.

1. ..........................................................................

2. ..........................................................................

03) දේශපාලන විද්‍යාව අධ්‍යයනය විෂයයක් ලෙස හැඩගැස්වීමට සහ වර්ධනයට ග්‍රීක දේශපාලන දාර්ශනිකයින් දෙදෙනෙක් ප්‍රබල ලෙස දායක විය. එම දෙදෙනා නම් කරන්න.

1. ..........................................................................

2. ..........................................................................

04) 1. පොදු කැමැත්ත සහ 2. නීතියේ ආධිපතිත්වය යන සංකල්ප ක්‍රමයත් ලෙස ඉදිරිපත් කළ දේශපාලන චින්තකයින් දෙදෙනා පිළිවෙලින් නම් කරන්න.

1. ..........................................................................

2. ..........................................................................

05) 1. ප්‍රජාතන්ත්‍රවාදය ජනතාවට අයත් ජනතාව විසින් ජනතාව සඳහා ක්‍රියාත්මක වන්නා වූ ආණ්ඩුක්‍රමයක් වේ.
2. "නූතන රාජ්‍යයන්හි විධායක වූ කලී වෙනත් දෙයක් නොව ධනපති පංතියේ කටයුතු කළමණාකරණය කරන කමිටුව වේ.

නූතන රාජ්‍යයන්හි ආණ්ඩු සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති ප්‍රකාශ දෙක ඉදිරිපත් කළ දේශපාලන චින්තකයින් දෙදෙනා පිළිවෙලින් නම් කරන්න.

1. ..........................................................................

2. ..........................................................................

06) 1. විධායකය හා ව්‍යවස්ථාදායකය අතර පවත්නා සම්බන්ධතාව දුරස්ථවේ.
2. විධායකය හා ව්‍යවස්ථාදායකය අතර පවත්නා සම්බන්ධතාව බෙහෙවින්ම සමීප වන අතර එම හේතුවෙන් ආයතන දෙක අතර පවතින්නේ අන්‍යෝන්‍ය රඳා පැවැත්මකි.
ඉහත දක්වා ඇති විධායක ව්‍යවස්ථාදායක සම්බන්ධතා දැකිය හැකි ආණ්ඩුක්‍රම පිළිවෙලින් නම් කරන්න.

1. ..........................................................................

2. ..........................................................................

07) 1. දේශපාලන බලය අල්ලා ගැනීම ප්‍රධාන අරමුණ වේ.
2. දේශපාලන බලය හසුරුවන අයට බලපෑම් කිරීම මගින් පෞද්ගලික අංශ වර්ධනය කර ගැනීම සැලකිලිමත් වන ප්‍රධාන කරුණ වේ.
ඉහත දක්වා ඇති ප්‍රකාශ දෙකට අදාළ වන සංවිධාන වර්ග දෙක පිළිවෙලින් නම් කරන්න.

1. ..................................................................................................................................

2. ..................................................................................................................................

08) 1. ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයාගේ නිල කාලය සහ එක් පුද්ගලයකුට ජනාධිපති තනතුරට තේරී පත්විය හැකි වාර ගණන කොපමණද ?
2. ප්‍රංශ ජනාධිපතිවරයාගේ නිලකාලය හා එක් පුද්ගලයකුට ජනාධිපති තනතුර දැකිය හැකි වාර ගණන කොපමණද ?

1. ..................................................................................................................................

2. ..................................................................................................................................

09) 1. බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයෙහි දේශපාලන විධායකය නම් කරන්න.
2. බ්‍රිතාන්‍යයේ අධිකරණ ව්‍යුහය තුළ ඉහළම අධිකරණය නම් කරන්න.

1. ..................................................................................................................................

2. ..................................................................................................................................

10) 1. ස්විට්සර්ලන්තයේ සන්ධිය මණ්ඩලයේ (Federal Coucil) සංයුතිය සහ එම මණ්ඩලයේ සාමාජිකයන් පත්වන ආකාරය දෙවර්ගයකි. එම මන්ත්‍රීවරුන් දෙවර්ගය නම් කරන්න.
2. ඉන්දියාවේ මධ්‍ය ආණ්ඩුවේ රාජ්‍ය සභාව නමින් හැඳින්වෙන දෙවන මණ්ඩල සමන්විත වන්නේ මන්ත්‍රීවරුන් දෙවර්ගයකිනි. එම මන්ත්‍රීවරුන් දෙවර්ගය නම් කරන්න.

1. ..................................................................................................................................

2. ..................................................................................................................................

11) බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන ක්‍රමය යටතේ වාර්ගික නියෝජන ක්‍රමය හඳුන්වා දුන් සහ එම නියෝජන ක්‍රමය අහෝසි කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ දෙක පිළිවෙලින් නම් කරන්න.

1. ..................................................................................................................................

2. ..................................................................................................................................

12) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඉතිහාසය තුළ සීමිත ඡන්ද බලය හඳුන්වා දුන් සහ සර්වජන ඡන්ද බලය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ දෙක පිළිවෙලින් දක්වන්න.

1. ..................................................................................................................................

2. ..................................................................................................................................

13) 1. බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනයෙන් නිදහස ලබා ගැනීමේ ව්‍යාපාරය දියත් කිරීම සඳහා ලාංකිකයින් විසින් පිහිටුවන ලද ප්‍රථම ජාතික සංවිධානය කුමක්ද ?
2. ලංකාවේ ප්‍රථම වාමාංශික පක්ෂය නම් කොට එය ආරම්භ කළ වර්ෂය දක්වන්න.

1. ..................................................................................................................................

2. ..................................................................................................................................

14) 1. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ අමාත්‍ය මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව දක්වන්න.
2. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ අමාත්‍යවරුන් පත් කිරීමේ බලය හිමි වුයේ කාටද ?

1. ..................................................................................................................................

2. ..................................................................................................................................

15) 1. 1948 සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රැජිනගේ ලංකා නියෝජිතයා හැඳින්වූ නිල නාමය කුමක්ද ?
2. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රැජිනගේ නියෝජිතයා එම තනතුරට පත් කළ ආකාරය දක්වන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

16) 1. 1972 ආන්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නාමික විධායකය පත් කළ ආකාරය දක්වන්න.
2. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නාමික විධායකයේ නිලකාලය කොපමණද ?

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

17) 1. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නිර්මාණය කළ දේශපාලන විධායක සමන්විත වන්නේ කොටස් දෙකකි. එම කොටස් දෙක නම් කරන්න.
2. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නිර්මාණය කළ දේශපාලන විධායකයේ එක් කොටසක් පාර්ලිමේන්තුව සම්මත කරන විශ්වාසභංග යෝජනාවක් මගින් නිලයෙන් ඉවත් කළ හැකිය. එම කොටස නම් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

18) 19 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

19) ශ්‍රී ලංකාවේ පක්ෂ ක්‍රමය තුළ ප්‍රධාන පක්ෂ දෙක සඳහන් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

20) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් කළ හැකි ක්‍රම දෙක සඳහන් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

ද මැසිනොද් විදුහල - කඳාන

De Mazenod College - Kandana

25 . 11 . 2016

# දේශපාලන විද්‍යාව - II

පැය 3 යි

2016 දෙසැම්බර් | 13 ශ්‍රේණිය

උපදෙස් -

- **B** හා **C** කොටස් වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න
- එක් පිළිතුරකට හිමි ලකුණු සංඛ්‍යාව **20** කි මුලු ලකුණු **80** කි

## B කොටස

1) දේශපාලන විද්‍යාව රාජ්‍යය, බලය හා ආණ්ඩුව යන ත්‍රිත්වය මත ගොනු වී ඇත් ඔබ එකග වන්නේ ද? හේතු සාකච්ඡා කරන්න ( ලකුණු 20 )

2) පහත දැක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** පිළිබඳ ව අදහස් දක්වන්න
   1. ලිබරල්වාදී හා සමාජවාදී රාජ්‍යයක ලක්ෂණ
   2. ආණ්ඩුව හා එහි කාර්‍යභාර්ය
   3. ෆෙඩරල් ව්‍යවස්ථාවක ප්‍රධාන ලක්ෂණ
   4. කැබිනට් හා ජනාධිපති ආණ්ඩුක්‍රමය අතර වෙනස
   5. අධිකරණ ස්වාධීනත්වය

( ලකුණු 10 x 2 = 20 )

3) පහත දැක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** පිළිබඳ ව සාකච්ඡා කරන්න
   1. සමානාත්මතාවය හා නිදහස අතර පවත්නා සම්බන්ධතාවය
   2. මිනිසා නීතියට යටත්වීම පිළිබඳ යථාර්ථය
   3. මානව අයිතිවාසිකම් හා මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ විධික්‍රම
   4. සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපකරණයක් ලෙස ප්‍රාරම්භනය
   5. දේශපාලන සමාජානුයෝජනය හා සංස්කෘතිය අතර වෙනස

( ලකුණු 10 x 2 = 20 )

4) පහත දැක්වෙන ඕනෑම ඒවායින් **දෙකක්** පිළිබඳව පරීක්ෂා කරන්න
   1. ඇමෙරිකා එක්සත් ජනපදයේ **හෝ** ප්‍රංශයේ ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන්
   2. ඉන්දියානු ආණ්ඩුක්‍රමයේ **හෝ** ස්විට්සර්ලන්තයේ සන්ධිය මූලධර්ම
   3. බ්‍රිතාන්‍ය දේශපාලන ක්‍රමය තුල පාර්ලිමේන්තු ස්වාධිපත්‍යයේ ලක්ෂණ
   4. ගැටුම් කළමනාකරණ විධික්‍රම
   5. ගැටුම් සමථනය හා ගැටුම් විපරිවර්ථනය අතර පවතින වෙනස්කම්

( ලකුණු 10 x 2 = 20 )

## C කොටස

5)
   1. ලංකාව වැඩවසම් ක්‍රමයෙන් ධනවාදයට පරිවර්තනය වීමේ ක්‍රියාදාමයට පදනම ඇමුයේ කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය මගිනි ඔබ එකග වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න

   **නැතහොත්**

   2. 1921 දී ලංකා ජාතික සංගමය තුළ ඇති වූ සිංහල දෙමළ ඝට්ටනයේ දේශපාලන ප්‍රතිවිපාක පිළිබඳ ව රචනයක් ලියන්න

( ලකුණු 20 )

De Mazenod College Kandana Learning Resource Center R

6) පහත දැක්වෙන ඕනෑම මාතෘකා **දෙකක්** විශ්ලේෂණය කරන්න

1. 1931 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුකාරයාගේ බලතල, කාර්යයන් හා තත්ත්වය
2. 1931 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අමාත්‍ය මණ්ඩලය හා එහි කාර්යයන්
3. 1947 ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවයේ **හෝ** අධිකරණ සේවයේ ස්වාධීනත්වය සඳහා සැපයූ ව්‍යවස්ථාමය ආරක්ෂක විධිවිධාන
4. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුන් නවාංග
5. 1972 ව්‍යවස්ථාව යටතේ පිහිටවූ ව්‍යවස්ථාදායකයේ බලතල, කාර්යයන් හා තත්ත්වය

( ලකුණු 10 x 2 = 20 )

7) 1948 සෝල්බරි ව්‍යවස්ථාව හා 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ පහත දැක්වෙන දේශපාලන ආයතන **දෙක** සංසන්දනය කොට වෙනස්කම් දක්වන්න

1. නාමික විධායකය හා එහි කාර්යභාරය
2. ව්‍යවස්ථාදායකය හා එහි සංයුතිය

( ලකුණු 10 x 2 = 20 )

8) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන් විභාග කරන්න

( ලකුණු 20 )